# සවියෙන් පෙරට අපි එකට

## e - ඉගැනුම් පාසල

## හොරණ අධ්‍යාපන කලාපය

**11 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය**

## දෙවන වාරය

## 14 පාඩම

# පරිසර හිතකාමී වෙමු

**සැකසුම :- එන්.වයි.එස්. එස්. ඇල්බට්**

**බප/හෝ/ ප්‍රජාපතී බාලිකා විද්‍යාලය**



ඉගෙනුම් උපකරණ :- වනාන්තර වල පින්තූර කීපයක්

- **පරිසරය යනු කුමක් ද ?**

අප අවට ඇති වටපිටාව පරිසරය ලෙස හැඳින්වි ය හැකිය.

එය ජීවි හා අජීවි පරිසරය ලෙස කොටස් දෙකකට බෙදිය හැකි ය

# ජීවි පරිසරය

මිනිසා මෙන්ම සතා සිව්පාවුන්ද ගස් වැල්ද ජීවි පරිසරයට අයත් වේ.



# අජීවී පරිසරය

අජීවී පරිසරය පණ නැති වස්තූන්ගෙන් සමන්විතය.හිරු,සඳු,අහස,මහපොළොව,කඳුහෙල්,අව්ව,වැස්ස,සුළඟ,ජලය ඊට අයත් ය.



# පරිසරය හා බුදු දහම

මිනිසාගේ යුතුකම විය යුත්තේ පරිසරය ආරක්ෂා කිරීමයි.ඒ සඳ හා පරිසරයට ආදරය කරන මිනිසුන් බිහිවිය යුතුය. මේ ලෝක යේ පරිසරයට හිතෛෂීව කටයුතු කල මිනිසුන් අතර ප්‍රමුඛත්ව ය හිමිවන්නේ බුදුරජාණන් වහන්සේට ය. බෝධිසත්ව චරිතය තුලිනුත් , බුද්ධ චරිතය තුලිනුත් , දේශනා කල ධර්මය තුලිනු ත් , ජීවි අජීවි පරිසරය කෙරෙහි පැවති ලෙන්ගතුකම කොතෙක් ද යන්න වටහා ගත හැකිය.

බුදු සිරිත හා සම්බන්ධ පරිසරයේ සිදුවීම් කීපයක්

# ඉපදීම



# වප් මගුල් උත්සවය



# දුෂ්කර ක්‍රියාව



# බුද්ධත්වය



# ප්‍රථම ධර්ම දේශනය



# දහ වන වස් කාලය

## පාරිලෝය වනයෙහි වැඩ වසමින් ඇතෙකුගේ හා වඳුරෙකුගේ උ වටැන් ලැබීම



පරිසරය සුරැකීම පිළිබඳව බුදු දහම තුලින් බොහෝ දේ දැනගත හැකිය. ඒවා නම්

- ජලය
- වාතය
- තුරුලතා

# ජලය

ජලය යනු අපට හිමි ස්වභාවික සම්පතකි. බුදු රදුන් විසින් ජලය පරිහරණය කිරීම පිළිබඳව විනය නීති පනවා ඇත.

- ජලයට කෙල ගැසීම නොකල යුතුය.
- ජලයට මළ මුත්‍රා කිරීම නොකල යුතුය.
- ජලයට වමනය නොකල යුතුය.
- ජලය පෙරා පානය කල යුතුය. ඒ සඳහා පෙරහන්කඩක් නි ර්දේශ කරන ලදි.
- ජලයට කැලි කසල දැමීම නොකල යුතුය.

# අපවිත්‍ර ජලාශයක්



ජලය සම්පතක් ලෙස අරපිරිමැස්මෙන් පරිභෝජනය කල යුතු ය.



# වාතය

තුරුලතා මෙන්ම සත්ව ප්‍රජාවද වාතය ආශ්වාස ප්‍රාස්වාස කිරී මෙන් ජීවත් වන බව ප්‍රකටය. හුස්ම පොද පවිත්‍ර වීම ඉතා වැදග ත් වේ. අප සමාජයේ බොහෝ අය සිදු කරන ක්‍රියා දැන හෝ නොදැන වායු දූෂණය සිදුවේ.

## වායු දූෂණය සිදුවන අවස්ථා

- කාර්මික දියුනුව නිසා
- යන්ත්‍ර සූත්‍ර මෙන්ම රථ වාහන මගින් පිටවන දුම
- කැලෑ ගිනි තැබීම
- අප ද්‍රව්‍ය ගිනි දැල්වීම
- පරිසරයට මුදාහරින කැලිකසල







ඉතා පිරිසිදු සුළං පොදක පහස ලැබීමට නම් අප අපේ වායු දූෂ
ණය වළක්වා ගැනීමට ක්‍රියා කල යුතුය.



# තුරුලතා



බොහෝ භික්ෂූන් වහන්සේලා තමන්ගේ විමුක්ති මාර්ගය සෙවී ම පිණිස ආරණ්‍ය,ගස් සෙවන ඇසුරු කල බව අපට පෙනේ.



පරිසරය ආරක්ෂා කිරීම පිණිස බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලාට විනය නීති පනවා ඇත.

- උපසපන් භික්ෂුන් වහන්සේලාට ගස් වැල් කැපීම තහනම් වීම.

- ඉඩකඩ ඇති සෑම තැනකම ගසක් රෝපණය කල යුතුය.

බුදු රජාණන් වහන්සේ බුද්ධත්වය ලබා දෙවන සතියේදි ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ දෙස සතියක් ඇසිපිය නොහෙලා බලා

සිටිමින් අනිමිස ලෝචන පූජාවෙන් පෙන්වා දුන්නේද පරිසර යේ වැදගත්කමයි.



එදිනෙදා පින් වැඩෙන ක්‍රියාවන් ලෙස බුදුරදුන් එක් දේවතාවෙ කුට පහත ක්‍රියා සිදු කල යුතුයි කියූ සේක.

- පලතුරු උයන් වතු වැවීම.

- ස්වභාවික වනාන්තර වැවීම.

- ඒ දඬු , පාලම් පැන්හල් , පොකුණු තනාදීම.

**ඇගයීම**

1. පරිසරය යනු කුමක් ද ?

2. අප ජීවත් වන පරිසරය දෙයාකාරය ඒවා නම් කරන් න. ?

3. බුදු සිරිත හා සම්බන්ධ පරිසරයේ සිදුවීම් 3ක් නම් ක රන්න. ?

අපි සැම අපේ පරිසරය රැක ගැනීමට ක්‍රියා කරමු. පරිසරය දූෂණය කරන අය දැනුවත් කොට ඔවුන් එයින් මුදා ගැනී මට ක්‍රියා කරමු.

